# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1939/33 – 2015 නොවැම්බර් 06 වැනි සිකුරාදා – 2015.11.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2015 අංක 187 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/2/2014/එච්ජ්/439.
ප්‍රා.ලේ.ගේ යොමු අංකය: ඩීඑස්/ටීඩබ්ජ්/එල්ඒඑන්/4/ඉ.අ./11.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් අමාත්‍ය මුනසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

2015 නොවැම්බර් මස 05 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
අංක 1200/6, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා**.– ප්‍රාදේශීය ලේකම්, තවලම.

2. **ඉඩමේ විස්තරය**.– දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තවලම (අ.ග.පි. 483) ගමේ පිහිටි ගාල්ල දිස්ත්‍රික් භාර මැනුම් අධිකාරි විසින් 2015.04.08 දින පිළියෙල කරන ලද ප්‍රගමන අනුරේඛන අංක ජීඒ/ටීඩබ්එල්/2015/230 කැබලි අක්ෂර 'ඒ' සහ 'බී' ලෙස පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.2370 ක් පමණ වූ පහත සඳහන් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ගොඩ්ඩුගෙදරවත්ත – ප්‍රමාණය: හෙක්. 0.1878**
උතුරට: හීන් ඇළ, බී. ඩබ්ලිව්. කරුණාරත්න හිමිකම් කියන ගොඩ්ඩුගෙදරවත්ත සහ මාර්ගය (මා.සං.අ.); නැගෙනහිරට: බී. ඩබ්ලිව්. කරුණාරත්න හිමිකම් කියන ගොඩ්ඩුගෙදරවත්ත, මාර්ගය (මා.සං.අ.), වික්‍රමනායක කරුණාරත්න ජයනෙත්ති හිමිකම් කියන ගොඩ්ඩුගෙදරවත්ත සහ කැබලි අක්ෂර බී; දකුණට: වික්‍රමනායක කරුණාරත්න ජයනෙත්ති හිමිකම් කියන ගොඩ්ඩුගෙදරවත්ත සහ කැබලි අක්ෂර බී; බටහිරට: හීන් ඇළ සහ බී. ඩබ්ලිව්. කරුණාරත්න හිමිකම් කියන ගොඩ්ඩුගෙදරවත්ත.

02. **කැබලි අක්ෂර 'බී' – ගොඩ්ඩුගෙදරවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0492**
උතුරට: හීන් ඇළ සහ කැබලි අක්ෂර ඒ; නැගෙනහිරට: වික්‍රමනායක කරුණාරත්න ජයනෙත්ති හිමිකම් කියන ගොඩ්ඩුගෙදරවත්ත; දකුණට: වික්‍රමනායක කරුණාරත්න ජයනෙත්ති හිමිකම් කියන ගොඩ්ඩුගෙදරවත්ත සහ රිල්ලවල ඇළ; බටහිරට: හීන් ඇළ සහ කැබලි අක්ෂර ඒ.

11 – 627